# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2133/45 - 2019 ජූලි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2019.07.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ගොනු අංකය : 13/98/PC/200.
ප්‍රාදේශීය ලේකම් ගොනු අංකය : බෙන්/2/7/3/15/11.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර :-

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 8 සී - අතුරුවැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉඳුරුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ගා 4322 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 සහ 2 ලෙස සඳහන් ''කුරුන්ටුවත්ත'' නැමති ඉඩම් කොටස් 2.

01. **කැබලි අංකය 01**
ඉඩමේ නම: කුරුන්ටුවත්ත; ඉඩමේ විස්තරය: සුසාන භූමිය; ප්‍රමාණය: හෙක්. 0.0791

02. **කැබලි අංකය 02**
ඉඩමේ නම: කුරුන්ටුවත්ත; ඉඩමේ විස්තරය: සුසාන භූමිය; ප්‍රමාණය: හෙක්. 0.1241

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.09.25 වැනි දින පෙ.ව. 10.00 ට බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019.09.18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශ්‍යතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩබ්. ඩබ්. කේ. විතානගේ,
ප්‍රාදේශීය ලේකම්,
බෙන්තොට.

2019 ජූලි මස 22 වැනි දින,
බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 353



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/8/2017/PC/515.
*මගේ අංකය* : BER/4/5/2/58.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 765, අළුත්ගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ, අළුත්ගම ගමෙහි පිහිටි සර්වේ ජනරාල්ගේ මූලික පිඹුරු අංක ක. 4757 දරන පිඹුරේ කැබලි අංක 01 මගින් පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0885ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

**කැබලි අංක 01**

ඉඩමේ නම: දෙහිගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: සෙම්බකුට්ටි කංකානම්ගේ සැම්සන් ප්‍රනාන්දු; ප්‍රමාණය: හෙක්. 0.0885.

මායිම් විස්තරය :

උතුර: මාර්ගය සහ බී. ඉඳුනිල් ප්‍රනාන්දු හිමිකම් කියන දෙහිගහවත්ත සහ පාර; නැගෙනහිර: බී. ඉඳුනිල් ප්‍රනාන්දු හිමිකම් කියන දෙහිගහවත්ත, පාර සහ වැලිපැන්න පාර; දකුණ: වැලිපැන්න පාර සහ සංඝමිත්තා බාලිකා විද්‍යාලය හිමිකම් කියන සෙල්ලගේවත්ත; බටහිර: සංඝමිත්තා බාලිකා විද්‍යාලය භුක්ති විඳින සෙල්ලගේවත්ත සහ ළිඳමුලගේ වත්ත, (මු.පි.ක. 2386හි කැබලි අංක 1).

ඉහත සඳහන් ඉඩම්වලට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.08.26 වැනි දින පෙ. ව. 10.00 ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019.08.19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. ජී. ඩී. චතුර මල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2019 ජුලි මස 10 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 354

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.